www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# රාජපක්ෂ ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරනයෙන් යන්තම් ජය ලබයි

## Rajapakse narrowly wins Sri Lankan presidential election

**කේ. රත්නායක විසිනි**

**2005 නොවැම්බර් 19**

බ්‍රහස්පතින්දා පැවති ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරනයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ (ශ්‍රීලනිප) අපේක්ෂක අගමැති මහින්ද රාජපක්ෂ යන්තම් ජය ලැබී ය. රාජපක්ෂ සිය ප්‍රධාන ප්‍රතිවාදියා වූ ඡන්ද 4,694,623ක් නැත හොත් සියයට 48.4ක් ලබා ගත් එක්සත් ජාතික පක්ෂයේ (එජාප) රනිල් වික්‍රමසිංහට එරෙහිව ඡන්ද 4,880,950ක් නැත හොත් යන්තම් සියයට 50.29ක් ලබා ගති. නව ජනාධිපති ඊලඟ දින 14 ඇතුලත දිවුරුම් දෙනු ඇත.

රාජපක්ෂ දෙවන මනාප ගනන් කිරීමක් වලකාලමින් ව්‍යවස්ථානුකූලව අවශ්‍ය සියයට 50 ඡන්ද ප්‍රමානය ලබා ගත්තේ යන්තමිනි. ඔහුගේ වැඩි ඡන්ද ප්‍රමානය 1982 සිට මෙතෙක් පැවති ජනාධිපතිවරන හතරෙන් අඩුම ප්‍රමානය වූ අතර මෙවර තරගය තියුනු ලෙස ද්‍රවාන්තගත ඡන්දයකි. සිංහල ස්වෝත්තමවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සහ ජාතික හෙල උරුමය සමග මැතිවරන ගිවිසුම් අත්සන් කල රාජපක්ෂ සිය බලගතු ම සහයෝගය දිනා ගත්තේ දිවයිනේ සිංහල බහුතරයක් වෙසෙන දකුනෙනි. වික්‍රමසිංහ කොලඹ, මධ්‍යම කඳුකර දිස්ත්‍රික්කවල හා නැගෙනහිර මිශ්‍ර සිංහල, දෙමල හා මුස්ලිම් ප්‍රජාවන් අතර වඩා හොඳ සහයෝගයක් දිනා ගති.

පාලක පන්තිය සම්බන්ධයෙන් ගත හොත් මැතිවරනය කිසිවක් විසඳා නැත. රාජපක්ෂගේ ආන්තිකව පටු ජයග්‍රහනයෙන් අදහස් වන්නේ, ඊලඟ තන්ත්‍රය, කිසිදු ආකාර මහජන වරමකින් තොරව, පසු ගිය තන්ත්‍රය මෙන් ම අස්ථායි එකක් වනු ඇති බව යි. නව ජනාධිපතිට, තම පූර්වප්‍රාප්තිකයා වන චන්ද්‍රිකා කුමාරතුංගගෙන් උරුම වන්නේ, 1999 සිට මහා මැතිවරන හා ජනාධිපතිවරන පහක් නිර්මානය කර ඇති දේශපාලන අර්බුදයකි. ඔහු අතට බලගතු විධායක ජනාධිපති තනතුරේ බලය ලැබෙනු ඇති නමුත්, ඔහුගේ පාලක ශ්‍රීලනිප නායකත්වයෙන් යුත් සභාගය තවමත් පාර්ලිමේන්තුවේ සුලුතරයක් ලෙස පවතී. ආන්ඩුවේ හස්තයන් දෙක අතර නව ගැටුම් පැන නැගීමට නියමිත අතර දේශපාලන හිරවීමෙන් ගැලවීමේ මාවතක් සොයා ගැනීමේ ප්‍රයත්නයක් ලෙස තවත් මහ මැතිවරනයක් කැඳවීමට පවා නව ජනාධිපතිට බල කෙරීමට ඉඩ ඇත.

අර්බුදයේ හරි මැද පවතින්නේ රටේ 20 අවුරුදු සිවිල් යුද්ධය විසඳාලීමට ප්‍රධාන පක්ෂ දෙක ම අපොහොසත් වීම ය. තමන් සාම දූතයකු බවට කරන සාවද්‍ය කියා පෑම් තිබිය දී ම, රාජපක්ෂට ජවිපෙ හා හෙල උරුමය සමග පවත්නා මැතිවරන ගිවිසුම් යුද්ධය යලි ඇවිලීම සඳහා මාවත සකසා ඇත. මෙම සිංහල අන්තවාදී පක්ෂ දෙක, සුනාමි ආධාර බෙදා හැරීම සඳහා ආන්ඩුව හා දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය අතර ඇති කර ගත් ඒකාබද්ධ යාන්ත්‍රනය අහෝසි කරන ලෙස ද වත්මන් සටන් විරාමයේ කොන්දේසි බරපතලව සංශෝධනය කරන ලෙස ද ඉල්ලා සිටියහ. තථ්‍ය වසයෙන් ගත් කල අවසන් නිවේදන වන් කොන්දේසිවලට එකඟ වී ඇති රාජපක්ෂ එල්ටීටීඊය සමග සෘජුව සාකච්ඡා කරන බවට දුන් පොරොන්දු පත්‍රය මල ලේඛනයකි.

රාජපක්ෂ දැන් ජවිපෙට බොහෝ සෙයින් දේශපාලනිකව නයගැති ය. ජවිපෙ නායක විමල් වීරවංශ ඔහුගේ ප්‍රධාන දේශපාලන උපදේශක ලෙස පත් කිරීමත් සමග, සංවිධානය ඔහුගේ මැතිවරන ව්‍යාපාරය තුල ප්‍රමුඛ ක්‍රියා කලාපයක් ඉටු කලේ ය. ජවිපෙ නායකයන් ඔහුගේ රැස්වීම් වේදිකාවල දක්නට ලැබුනු අතර පක්ෂ සාමාජිකයෝ මැතිවරන ව්‍යාපාරයේ බිම් මට්ටමේ වැඩ කටයුතු බොහොමයක නිරත වූහ. ජවිපෙ දැන්, තමන් දුන් සහයෝගය වෙනුවෙන්, ජ්‍යෙෂ්ඨ අමාත්‍යංශ ඇතුලුව, ඉහල මිලක් ඉල්ලා සිටිනු ඇත. මෙය තුඩු දෙනු ඇත්තේ ජවිපෙ සමග ගැසූ ගිවිසුමේ ඥානවන්ත භාවය අරබයා ශ්‍රීලනිප තුල ඇවිලුනු තියුනු මතභේද තව දුරටත් තීව්‍ර වීමට යි.

වඩාත් අති මූලිකව ගත් කල, ජවිපෙ සාමාජිකයන් ආන්ඩුවේ මූලික තනතුරුවලට පත් කිරීම සමස්ත නිල සංස්ථාපිතයේ ම ඉරිතැලීමට හේතු වී ඇති දේශපාලන අර්බුදය උත්සන්න කරනු ඇත. ආන්ඩුවේ කොටස්කරුවකු ලෙස, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හා ලෝක බැංකුවේ ආර්ථික න්‍යාය පත්‍රය ක්‍රියාවට

දැමීමට ජවිපෙට බල කෙරෙන අතර මෙය ගම්බද දුගීන් අතර එයට පවත්නා පදනම තව දුරටත් විරසක කරනු ඇත. සිය ක්‍රියාවන්ගෙන් මහජන අවධානය අපසරනය කරනු වස්, ජවිපෙ එල්ටීටීඊයට එරෙහි සිය වාචාල ප්‍රහාර ඉහල දමනු ඇත්තේ, වාර්ගික ආතතීන් හා යුද තර්ජනය උත්සන්න කරමිනි.

කොලඹ ආන්ඩුව සමග සාම ගිවිසුමක් ඇති කර ගැනීම කල නො හැකි දෙයක් ය යන නිගමනය කරා එල්ටීටීඊය එලඹ ඇතැයි යන්න පිලිබඳව දැනට මත් අනතුරු හඟවන ලකුනු මතුව තිබේ. දිවයිනේ උතුරේ හා නැගෙනහිර දෙමල ජනයාට ඡන්දය දීමේ නිදහස ඇතැයි ප්‍රසිද්ධයේ ප්‍රකාශ කල නමුත්, එල්ටීටීඊ නායකත්වය නොවැම්බර් 17 දා "ශෝක දිනයක්" ලෙස නම් කලේ ය. එය තමන්ගේ අපේක්ෂකයකු ඉදිරිපත් කිරීමට අපොහොසත් වූ අතර, මැර බලය හා තර්ජන යොදා ගනිමින්, මෙම ප්‍රදේශ පුරා නිල නො වන ඡන්ද වර්ජනයක් බලාත්මක කිරීම සහතික කර ගති.

උතුරේ දී, වර්ජනය මුලුමනින් ම පාහේ බලපැවැත්වී ය. දිවයිනේ සමස්ත ඡන්දය දුන් ප්‍රතිශතය වන සියයට 75ට ප්‍රතිකූලව, යාපන දිස්ත්‍රික්කයේ, ඡන්දය දුන්නේ ලියාපදිංචි ඡන්දදායකයන්ගෙන් සියයට 1.2ක් පමනි. උතුරේ සෙසු දිස්ත්‍රික්කවල දී, ඡන්දය දුන් සංඛ්‍යා අඩු මට්ටම්වල පැවතුනි -- නිදසුනක් ලෙස එල්ටීටීඊ පාලනය යටතේ පවත්නා වන්නි දිස්ත්‍රික්කයේ එය යන්තම් සියයට 34.3කි. එල්ටීටීඊය එයින් කැඩී ගිය ප්‍රතිවාදී කන්ඩායමකට එරෙහිව ප්‍රදේශයේ පාලනය සඳහා දරුනු ගැටුමක යෙදී සිටින නැගෙනහිර දිස්ත්‍රික්කවල දී, ඡන්දය දුන් සංඛ්‍යාව සාමාන්‍යයෙන් සියයට 50කට අඩු විය.

අතීතයේ දී, එල්ටීටීඊය, "සාම ක්‍රියාදාමයේ" ප්‍රධාන අද්වකාත් ලෙස පෙනී සිටි වික්‍රමසිංහට ඡන්දය දෙන ලෙස උපදෙස් දීමේ ප්‍රවනතාවක් පැවතුනි. එල්ටීටීඊ නායකයන් සාම ක්‍රියාදාමය සැලකුවේ, උතුරේ නව ධනපති තන්ත්‍රයක් ලෙස තමන්ව තහවුරු කර ගැනීමේ ස්වකීය එල්ලය ක්‍රියාවට දැමීමේ හොඳම වාහනය ලෙස ය. එහෙත්, මීට වසර දෙකකටත් වඩා ඉහත දී සාම සාකච්ඡා ඇන හිටීමෙන් පසුව අවිනිශ්චිත තත්වයකට ඇද වැටී ඇති සහ එලෙස ම උතුරේ හා නැගෙනහිර ජනයාගේ ජීවන මට්ටම් වැඩි දියුනු කිරීමට එය අපොහොසත් වීම හා එහි ප්‍රජාතන්ත්‍ර විරෝධී විධි ක්‍රම හේතුවෙන් සාමාන්‍ය දෙමල ජනයා වෙතින් වැඩෙන වෛරයට ද මුහුන දී සිටින එල්ටීටීඊය සියලු "සිංහල දේශපාලනඥයන්ට" එරෙහි සිය වාර්ගික පුච්චානම් ව්‍යාපාරය උත්සන්න කර තිබේ. මැතිවරනය තුල ඔවුන් ගත් ආස්ථානය මිලිටරි ගැටුමක් කරා තල්ලු වී යාම පිලිබඳ තවත් සලකුනකි.

වික්‍රමසිංහ උතුරේ හා නැගෙනහිර අලුතින් මැතිවරනයක් කැඳවන ලෙස තර්ජනය කරයි. එහෙත් රාජපක්ෂ පරාජය කිරීමට ඔහු අපොහොසත් වීම එජාපයේ මහ ව්‍යාපාරික න්‍යාය පත්‍රයේ සෘජු නිෂ්පාදිතයකි. ඔහු "සාම ක්‍රියාදාමය" තොරොම්බල් කරන්නේ, යුද්ධය අවසන් කොට රට විදේශ ආයෝජන සඳහා විවෘත කරන ලෙස සංගත නායකයන් හා මහ බලවතුන් ඉදිරිපත් කරන ඉල්ලීම්වලට අනුකූල ක්‍රියාවක් ලෙස ය. 2001 සිට 2004 දක්වා ඔහු අගමැති ලෙස බලයේ සිටි කාලය තුල, වික්‍රමසිංහ, රට පුරා කම්කරුවන් අතර පුලුල්ව පැතිරුනු අසහනයක් හා විරුද්ධත්වයක් නිර්මානය කිරීමට තුඩු දුන් දුර දිග යන ආර්ථික ප්‍රතිව්‍යුහකරන හා පුද්ගලීකරන වැඩ පිලිවෙලක් ආරම්භ කලේ ය.

ශ්‍රීලනිපය ද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හා ලෝක බැංකුවේ ඉල්ලීම් ක්‍රියාවට දමා ඇති නමුදු, රාජපක්ෂ උත්සාහ කලේ, මහජනතාවගේ ඉරනම සමග සහානුමතික වන ගමෙන් පැමිනි "සාමාන්‍ය මිනිසකු" ලෙස තමාව තොරොම්බල් කර ගැනීම මගින් එජාපයේ වාර්තාව ගසා කෑමට යි. රැකියා, පොහොර සහනාධාර හා සමාජ සේවාවන් කප්පාදු කල පුද්ගලීකරනය වේගවත් කල ව්‍යාපාරික ප්‍රතිසංස්කරන බලාත්මක කල තැනැත්තෙකු ලෙස වික්‍රමසිංහ තව මත් දකිනු ලැබිනි. අපේක්ෂකයන් දෙදෙනා ම දීර්ඝ මැතිවරන පොරොන්දු ලැයිස්තු ඉදිරිපත් කල අතර, ඒවා ක්‍රියාවට දැමිය නො හැකි බවත් ඒවා විශ්වාස කරන්නේ අතලොස්සක් පමනක් බවත් ඔවුහු දැන සිටියහ.

මූල්‍ය කව වික්‍රමසිංහගේ ජයග්‍රහනය පිලිබඳ බලාපොරොත්තු කඩා වැටීමට තියුනු ලෙස ප්‍රතිචාර දැක්වී ය. සඳුදා සමස්ත කොටස් මිල දර්ශකය ඒකක 39.95කින් වැටීම ඩේලි මිරර් පත්‍රය විසින් ආරෝපනය කරන ලද්දේ, රාජපක්ෂ සහ "වෙලඳ පොල හිතැති" වික්‍රමසිංහ අතර" කරට කර තරගයට" යි. වික්‍රමසිංහගේ ජයග්‍රහනය පිලිබඳ බලාපොරොත්තු ඉහල දමමින්, එල්ටීටීඊය සිය ඡන්ද වර්ජන තීන්දුව වෙනස් කර ඇති බවට, පැතිර ගිය කටකතා මධ්‍යයේ, බදාදා සමස්ත කොටස් මිල දර්ශකය වාර්තාගත අගයකින් ඉහල නැගුනි. මැතිවරන දින, උතුරේ හා නැගෙනහිර ඡන්දය දුන් සංඛ්‍යාව පහල අගයන් ගැනීම "ව්‍යාපාරික-හිතැති වික්‍රමසිංහ පිලිබඳ බලාපොරොත්තු සුන් කර ඇති" බව පැහැදිලි වූ කල, මිල දර්ශකය 2,500 දක්වා ඒකක 51.4කින් වැටුනි.

බොහෝ ඡන්දදායකයෝ, ප්‍රධාන පක්ෂ දෙකත් ජවිපෙ හා හෙල උරුමය සහ කුඩා ධනේශ්වර පක්ෂ ඇතුලු, ඔවුන්ගේ සියලු සගයනුත් පිලිබඳව, කලකිරී සිටියහ. මැතිවරන ව්‍යාපාරය වාර්ගික රේඛා ඔස්සේ අතිශයින්

ම දුවාන්තගත වී තිබීම නො තකා, සැලකිය යුතු සංඛ්‍යාවක් "වමේ" පක්ෂ දෙකෙන් -- එක්සත් සමාජවාදී පක්ෂය (එසප) සහ නව වාමාංශික පෙරමුන (නවාපෙ) -- එකකට ඡන්දයක් දීම මගින් විරෝධතා ඡන්දයක් ප්‍රකාශයට පත් කිරීම තෝරා ගති. මෙම පක්ෂ දෙක ම තමන් සමාජවාදී බවත් ශ්‍රීලනිපයට හා එජාපයට විරුද්ධ බවටත් කියා පෑ නමුත් ඔවුහු මුලුමනින් ම ජාතිකවාදී දේශපාලනය මත පදනම් වන අතර ශ්‍රී ලංකා රාජ්‍යයට හා නිල දේශපාලන සංස්ථාපිතයට අනුගත වී ගනිති. එසප අපේක්ෂක සිරිතුංග ජයසූරිය ඡන්ද 35,319ක් ලබා ගත් අතර නව සම සමාජ පක්ෂයේ (නසසප) ඒජන්සියක් වන නවාපෙ ඡන්ද 9,286ක් ලබා ගති.

සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) අපේක්ෂක විජේ ඩයස් ඡන්ද 3,500ක් ලබා ගත් අතර එම ඡන්ද සියල්ල ම නියෝජනය කලේ ප්‍රධාන ධනපති පක්ෂ දෙකට පමනක් නොව "වාම" අපේක්ෂකයන්ට හා එජාපයේ හා ශ්‍රීලනිපයේ ඒජන්තයන් ලෙස තරග කල විවිධාකාර සෙසු අවශේෂ අපේක්ෂකයන්ට ද එරෙහි අව්‍යාජ සමාජවාදී හා ජාත්‍යන්තරවාදී විකල්පයක් දැනුවත්ව තෝරා ගැනීමකි. සසප ඡන්ද පක්ෂයට සෘජුව මැතිවරන උද්ඝෝෂනයේ යෙදිය නො හැකි වූ ප්‍රදේශ ද ඇතුලුව රට පුරා පැතිර තිබුනි.

මැතිවරන උද්ඝෝෂනය පුරා ම, සසප පැහැදිලි කලේ. ශ්‍රී ලංකාවේ දේශපාලන අර්බුදය සහ කම්කරු පන්තිය මුහුන දෙන ගැටලු හුදකලා ප්‍රපංචයක් නො ව, එක්සත් ජනපද මිලිටරිවාදයේ පුපුරන සුලු පැන නැගීම තුල සිය තියුනු ම ප්‍රකාශනය අත් පත් කර ගෙන ඇති, ගෝලීය ධනවාදයේ අර්බුදය තුල මුල් බැස ගෙන ඇති බව යි. එසපට හා නවාපෙට ප්‍රතිකූල ලෙස, සසප අවධාරනය කලේ, යුද්ධයට හා ගැඹුරු වන සමාජ අසමානතාවට ජාතික විසඳුමක් නැති බව යි. එක්සත් ජනපද මිලිටරිවාදයට හා ගෝලීය ධනවාදයේ කොල්ලකාරී ක්‍රියාකාරකම්වලට එරෙහිව ජාත්‍යන්තර කම්කරු පන්තියේ ප්‍රතිප්‍රහාරයක අවශ්‍යතාව පිලිබඳව ශ්‍රී ලංකාවේ හා කලාපයේ වැඩ කරන ජනතාව අතර සාකච්ඡාවකට මුල පුරනු පිනිස ඩයස් සිය මැතිවරන උද්ඝෝෂනය යෙදා ගත්තේ ය.

මැතිවරනයෙන් ඉක්බිතිව, යුද්ධයේ ක්ෂනික තර්ජනය සහ ජීවන මට්ටම්වලට එරෙහි ප්‍රහාරය තව දුරටත් උත්සන්න වනු ඇත. සසප, විජේ ඩයස්ට ඡන්දය දුන් සියල්ලන් ම *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* නිතිපතා කියැවීමටත් සසපයේ හා හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ක්‍රියා මාර්ගය හා ඉදිරි දර්ශනය බැරෑරුම්ව අධ්‍යයනය කිරීමටත් සසපට බැඳීම සඳහා ඉල්ලුම් කරන ලෙසත් දිරි ගන්වයි.

© www.wsws.org